guruwaraya.lk

**DP/GIT/2025/01**

මගේ අංකය : 6/10/GIT/2025
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2025 මැයි මස 30 දින

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2025

උක්ත වර්ෂයට අදාළ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය සඳහා පෙනී සිටීමට නියමිත පාසල් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් මේ සමග එවමි. ඉල්ලුම්පත්‍ර **2025 මැයි මස 30** දින සිට **2025 ජූනි මස 13** දින දක්වා යොමු කළ හැකි අතර එම දිනය නැවත දීර්ඝ කරනු නොලැබේ.

1. **අයදුම් කිරීම**
   මාර්ගගත ආකාරයෙන් (online) පමණක් අයදුම් කළ යුතු ය. ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,
   - නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Center" මත Click කර ඉන්පසු GIT - 2025 Student Registration (School) මත Click කිරීම මගින් හෝ,https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.
   - ඔබ වෙත දැනටමත් ලබාදී ඇති පරිශීලක නාමය (User Name) හා මුරපදය (Password) භාවිතා කර මාර්ගගත පද්ධතියට ප්‍රවේශ වන්න.
   - ඔබ පාසල වෙත ලබාදී ඇති school code හා password අස්ථානගත වී ඇත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් එම තොරතුරු ලබා ගන්න.

2. 2025 වර්ෂයේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන (2026 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා පළමුවර පෙනී සිටීමට නියමිත) සිසුන්ගේ අයදුම්පත් පමණක් යොමු කිරීම කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

3. ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීම ඉතාමත්ම නිවැරදිව සිදු කළ යුතු ය. ඉල්ලුම් කළ මාධ්‍ය කිසිදු හේතුවක් නිසාවත් පසු ව වෙනස් කරනු නොලබන බැවින් මුල් අවස්ථාවේදී ම නිවැරදිව සම්පූර්ණ කිරීම විදුහල්පතිගේ හා ගුරුවරුන්ගේ වගකීමක් වේ.

4. **බාගත කර ගැනීම**
   බාගත කරගැනීමෙන් පසු මුද්‍රණය කරගත් අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් ලබාගෙන එහි සියලු ම තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගෙන, අයදුම්කරුවන්ගේ අත්සන් ලබා ගත යුතු ය. එය අවශ්‍ය වුවහොත් පමණක් විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබා ගන්න. මාර්ගගත පද්ධතියට දත්ත ඇතුළත් කිරීමෙන් පසු බාගත කරගත් PDF පිටපත සහ ඔබ විසින් පද්ධතියට ඇතුළත් කිරීම සඳහා යොදාගත් Excel ගොනුවේ සියලු ම තොරතුරු නැවත එකිනෙක සන්සන්දනය කර බලා සියලුම අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත්ව ඇති බව තහවුරු කර ගැනීම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ හා විදුහල්පතිවරුන්ගේ පූර්ණ වගකීම වේ.

5. **විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්**
   ඔබ විද්‍යාලයෙන් දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් **"Special Education Needs Students' Additional Data"** හි ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන්,
   - රත්මලාන අන්ධ විදුහල, රත්මලාන
   - පොළොම්මාරුව අඳ/බිහිරි විදුහල, තංගල්ල යන විද්‍යාලවල

   විශේෂ විභාග මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින් එම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න.

guruwaraya.lk